**කොළඹ මහා නගර සභාව - 2020**

**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**-----------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**---------------------------------**

කොළඹ මහා නගර සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශන, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට කොළඹ මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-------------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**-------------------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.
  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

**(අ)** ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඡේද අංකය | විගණන නිරීක්ෂණය | නිර්දේශය |
|---|---|---|
| 1.2 (ඇ) (i) | ගිණුම් විෂයයන් 124 කට අදාලව මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වටිනාකම් හා ඊට අදාල උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.1,863,255,547 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර එකී වෙනස්කම්වලට හේතු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කල යුතුවේ. |
| 1.2 (ඇ) (i) | • වර්ෂ 19 කට පෙර සිට පැවත එන රු.12,052,233 ක්වූ ලැබිය යුතු ගිණුම් 24 ක ශේෂයන් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු ශේෂ අය කර ගැනිමට කටයුතු කළ යුතුවේ |
| | • වර්ෂ ගණනාවක සිට අඛණ්ඩව මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත්, නිලධාරීන් වෙත ලබා දී ඇති සුළු මුදල් හා විශේෂ අත්තිකාරම් ගිණුම්වල නිරවුල් නොවූ රු.2,955,604 ක ශේෂය නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු ශේෂ අයකර ගැනිමට කටයුතු කළ යුතුවේ. |
| | • සභාවට ලැබිය යුතු ණයගැති ශේෂ තුළ අක්‍රීය ගිණුම් 3615 කට අදාලව රු.412,426,061 ක වටිනාකමක් විය. | ලැබිය යුතු ශේෂ අයකර ගැනිමට කටයුතු කළ යුතුවේ. |
| | • වසර 19 කට පමණ පෙර සිට පැවත එන ගෙවියයුතු තැන්පත් රු.99,848,922 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. |

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම.**

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | ප්‍රමිතියේ 18.3 ඡේදය ප්‍රකාරව ප්‍රමිතියට අනුකූලව පිළියෙල කරනු ලබන ප්‍රථම මූල්‍ය ප්‍රකාශන බවට නගර සභාව විසින් පැහැදිලි සහ සීමාරහිත ප්‍රකාශනයක් කළ යුතු වුවද 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනයේ එවැනි ප්‍රකාශනයක් සිදුකර නොතිබුණි. | විගණන නිරීක්ෂණය හා එකඟ වන බව ප්‍රකාශ කරමි. | ගිණුම්කරණ ප්‍රමිත වලට අනුව මූල්‍යය ප්‍රකාශන පිළියෙල කිරීම. |

| | | | |
|---|---|---|---|
| **(ii)** | 2019 දෙසැම්බර් 24 දිනැති මහා නගර සහා මුලා පරිපාලනයට අදාල ගිණුම්කටයුතු පිළිබඳ නියෝග ඇතුළත් අංක 2155/6 දරන ගැසට් පත්‍රයේ 428 වගන්තිය ප්‍රකාරව ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය සිදුකර නොතිබූ අතර ඒ අනුව වත්කම් ක්ෂය කිරීමද ආරම්භ කර නොතිබුණි. | වත්කම් ප්‍රත්‍යාගණනය සිදුකරමින් පවතින අතර කෙටි කාලයක් තුළ නිම කිරීමෙන් පසු ආසන්නතම මූලා වර්ෂයට ඒ සම්බන්ධ ගැලපීම් සිදු කරන බව දැනුම් දෙමි. | මූලා පරිපාලනයට අදාල ගිණුම් කටයුතු පිළිබඳ නියෝගවලට අනුව කටයුතු කිරීම. |

## 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | සමාලෝචිත වර්ෂය අවසානය වන විට දී කොන්ත්‍රාත්කරුවන් සඳහා ප්‍රතිග්‍රහන ලිපි පමණක් නිකුත් කර තිබූ රු.492,292,297 ක කොන්ත්‍රාත් වටිනාකමක් සඳහා කිසිදු කළ වැඩ වාර්තාවක්, අත්තිකාරම් ගෙවීමක් හෝ කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලද ඉන්වොයිසියක් නොමැතිව සාවද්‍ය ලෙස සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් ලෙස සහ වත්කම් හා වගකීම් ප්‍රකාශයේ කෙටිකාලීන ණයහිමියන් සඳහා අසම්භාව්‍ය වෙන් කිරීමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2021 වර්ෂයේ සිට කොන්ත්‍රාත් සඳහා ණය ප්‍රතිපාදන වෙන් කිරීම සත්‍ය වශයෙන් වැඩ නිම කළ ප්‍රතිශතය මත පදනම්ව සිදු කරන අතර එම කොන්ත්‍රාත්වල වැඩ නිම කළ ප්‍රමාණය වර්ෂය තුළ ආරම්භ කළ එහෙත් අවසන් නොකළ වැඩ ලෙස මූලා තත්ව ප්‍රකාශයේ ගැළපීම් කරනු ලැබේ. | ණය හිමියන් ලෙස හඳුනාගැනීමෙන් පසුව පමණක් මූලා ප්‍රකාශනවල ඇතුලත් කිරීම. |

## 1.6.3 නොසැසඳු ගිණුම්

---------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|
| ගිණුම් විෂයන් 51 සම්බන්ධයෙන් මූලා ප්‍රකාශනවල දක්වා ඇති වටිනාකම ඊට අදාල වාර්තා අනුව දක්වා ඇති වටිනාකමට වඩා රු.810,274,585 ක් වැඩියෙන් දක්වා තිබූ අතර ගිණුම් විෂයන් 38 ක් සම්බන්ධයෙන් මූලා ප්‍රකාශනවල දක්වා ඇති වටිනාකම ඊට අදාල වාර්තා අනුව දක්වා ඇති වටිනාකමට වඩා රු.8,637,902 ක් අඩුවෙන් දක්වා තිබුණි. | මෙවැනි අඩුපාඩු නැවත සිදු නොවන පරිදි කටයුතු කරන ලෙස අදාල නිළධාරින්ට උපදෙස් දී ඇත. | වැය ලෙජර හා අනිකුත් උපලේඛන නිවැරදිව පවත්වා ගැනීමට කටයුතු කිරීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,346,459,923 ක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.771,876,261 ක් විය.

## 2.2 මූල්‍ය පාලනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | ස්ථාවර බැංකු අයිරාව දිගින් දිගටම ඉහල යාම හේතුවෙන් 2020 දෙසැම්බර් 31 දිනට බැංකු අයිරාව රු.2,054,730,082 ක් වූ අතර සමාලෝචිත වර්ෂය තුල බැංකු අයිරා පොලිය රු.111,426,197 ක් වී තිබුණි. | රට තුළ පැවති වසංගත තත්ත්වය මත අපේක්ෂිත ආදායම් ශීඝ්‍ර අඩුවීමත් වියදම්වල වර්ධනයත් මෙම තත්ත්වයට සෘජුව බලපාන ලද බව පෙන්වා දෙමි. | ආදායම් සහ වියදම් මනා ලෙස පාලනය කිරීම තුළින් විධිමත් මූල්‍ය පාලනයක් පවත්වා ගැනීම. |

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම්**<br>2020 දෙසැම්බර් 31 දිනට මුළු හිඟ වරිපනම් ශේෂය රු.3,927,748,364 විය. එම මුළු හිඟ වරිපනම් ශේෂ අතුරින් රුපියල් ලක්ෂ පහ ඉක්මවූ දේපල 990 ක් වූ අතර එහි හිඟ වරිපනම් බදු ශේෂය රු.1,733,724,967 ක් විය. එසේම මෙම හිඟ දේපළ අතුරින් දේපළ 179 ක් රජයේ දේපළ වන අතර එහි හිඟය රු.500,358,629 විය. මෙම දේපළ අතුරින් දේපළ ඒකක 687 ක් 2020 වර්ෂයේ කිසිදු හිඟ මුදලක් ගෙවා නොතිබුණි. රුපියල් මිලියන 10 ඉක්මවූ හිඟ වරිපනම් බදු දේපළ සංඛ්‍යාව 24 ක් වූ අතර එහි වටිනාකම රු.444,439,653 ක් විය. | හිඟ අයකර ගැනීමට කටයුතු කරමින් පවති. | හිඟ වරිපනම් අයකර ගැනීමට ක්‍රියා කිරීම. |

**(ආ) පදික කඩකුලි**

-----------------

| | | | |
|---|---|---|---|
| | 2020 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු පදික කඩකුලි ආදායම රු.552,022,106 ක් වූ අතර එම වටිනාකම වර්ෂයේ බිල් කිරිම මෙන් සියයට 524 පමණ විය. මෙම හිඟ වටිනාකම තුල රු.119,851,013 ක් වූ අක්‍රිය පදික කඩකුලියක්ද අන්තර්ගතව තිබූ අතර මෙම ප්‍රමාණය අයකර ගැනීමට හෝ ලියා හැරිමට කටයුතු කර නොතිබුණි. | රු.50,957,617 ක් වූ හිඟ කුලිය කපා හැරීම සඳහා පළාත් පාලන කොමසාරිස් අනුමැතිය ලබා ගැනීමටත් ඉතිරි හිඟ කුලී අයකර ගැනීමටත් කටයුතු කරමින් පවති. | අක්‍රීය පදික කඩ කුලී විධිමත් ලෙස කපා හැරිමටත් කඩිනමින් හිඟ කුලී අයකර ගැනීමටත් ක්‍රියා කිරිම. |
| (ඇ) | 2014 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා රථවාහන ගාස්තු අයකිරිම සඳහා ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත් වලින් 2020 දෙසැම්බර් 31 දින වන විට කොන්ත්‍රාත්කරුවන් 92 න් අයකර ගත යුතු හිඟකුලි මුදල රු.135,373,482 ක් වූ අතර අයකර ගැනීම සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. | කඩිනමින් අයකර ගැනීමට කටයුතු කිරිම සහ නිත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

මහා නගර සහා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

--------------------------------------

| | විගණන නිරික්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොළඹ මහා නගර සභාව සතු කොළඹ 08 ඇල්විටිගල මාවතේ සුසානභූමි පාලකගේ නිල නිවස හිමි පර්චස් 40 ක පමණ භූමියේ පර්චස් 11 ක පමණ භූමියක වර්ග අඩි 6000 ක මහල් දෙකක් අනවසර ලෙස ඉදිකර තිබුණි. මෙම ගොඩනැගිල්ලෙහි නගර සභා සේවකයකු විසින් ව්‍යාපාරයක් පවත්වාගෙන ගොස් තිබුණි. මේ අනුව මෙම දේපළ කඩිනමින් සභාව වෙත ආපසු පවරා ගැනීමටත්, සභාවට සිදුවී ඇති අලාභය ගණනය කර අයකරගැනීමටත්, අවභාවිතාව සිදු කර ඇති නිළධාරියාට එරෙහිව කඩිනමින් විනය ක්‍රියාමාර්ග ගැනීමටත් කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නැත. | නිත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීම |
| (ආ) | තෝරාගත් සහා බල ප්‍රදේශයක පාර්කින් මීටර් සවිකිරීම මඟින් රථ වාහන ගාල් කිරිම සඳහා පුද්ගලික සමාගමක් සමඟ ගිවිසුම්ගත වී තිබූ අතර 2020 දෙසැම්බර් 31 දිනට අදාළ සමාගමෙන් අයවිය යුතු හිඟ කුලී ආදායම රු.101,161,649 විය. | පිළිතුරු ලබාදී නැත. | නිත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීම |

| | | | |
|---|---|---|---|
| (ඇ) | වර්ෂ 19 ට පෙර සිට පැවත එන රු.4,187,033 ක් වූ ලැබිය යුතු ශේෂ අයිතම 7 ක් සහ වර්ෂ 17 ක සිට අබන්ඩව මුල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කර තිබෙන නිළධාරීන් අතැති මුදල් ශේෂය රු.3,175,539 ක් සමාලෝචිත වර්ෂය තුලදීත් නිරවුල් කර නොතිබුණි. | කඩිනමින් නිරවුල් කිරිමට කටයුතු කරන බව දන්වමි. | ලැබිය යුතු මුදල් සහ නිළධාරීන් අතැති මුදල් අයකර ගැනිමට කටයුතු කිරිම. |
| (ඈ) | සේවක ණය ශේෂ තුල සේවකයින් 867 දෙනෙකුට අදාළව රු.12,127,529 ක අක්‍රිය ණය ශේෂ වටිනාකම නිරවුල් කර නොතිබුණි. | ඉදිරියේදී නිරවුල් කිරිමට පියවර ගෙන ඇත. | අයකර ගැනීමට හෝ අය නොවන ශේෂ විධිමත් ලෙස පොත් වලින් ඉවත් කිරිමට කටයුතු කිරිම. |
| (ඉ) | වර්ෂ 19 ට පෙර සිට පැවත එන රු.104,956,346 ක් වූ ආපසු ගෙවිය යුතු තැන්පත් නිරවුල් කිරිමට කටයුතු කර නොතිබුණි. | කඩිනමින් නිරවුල් කිරිමට පියවර ගෙන ඇත. | ආදායමට ගැනීමට හෝ නිරවුල් කිරීමට පියවර ගැනීම. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

--------------------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අංක 20, මැගසින් පාර බොරැල්ල පිහිටි පර්චස් 17.7 ඉඩම 1983 සැප්තැම්බර් 13 දින වර්ෂයක කාලයකට බදු දී තිබූ අතර, ගිවිසුම 1984 සැප්තැම්බර් 12 දින අවසන් වුවද 2020 දෙසැම්බර් 31 දින වන විටත් නව ගිවිසුමකට එළඹ නොතිබුණි. 2021 දෙසැම්බර් 31 දිනට සභාවට අයවිය යුතු හිඟ බදු මුදල රු.1,025,871 ක් විය. මෙම භූමියේ අනවසර ගොඩනැගිලි ඉදිකර විවිධ ව්‍යාපාරික කටයුතු සඳහා භාවිතා කරමින් පැවතියත් ඒ සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | දේපළ පවරා ගැනීමට අවශ්‍ය කටයුතු ආරම්භ කිරිම සඳහා පියවර ගෙන ඇත. | නීත්‍යානුකූල නොවන ගිවිසුම් අවලංගු කිරිම, අනවසර ඉදි කිරිම් ඉවත් කිරිම, නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීම සහ සභාවට සිදු වී ඇති පාඩුව අයකර ගැනීම. |
| (ආ) | අංක 32 මුදලිගේ මාවත කොළඹ 01 ඉදිකර ඇති වර්ග මීටර් 2143.75 (B +G + 6 ) ක් වූ තට්ටු 7 යුත් පරිශ්‍රය පරික්ෂා කිරිමේදී ගොඩනැගිල්ලේ බිම් මහල පොලොව මට්ටමේ පැවතිය යුතු වුවත් පොලොවට වඩා මිලි මීටර් 380ක් උසින් බිම් මහල ඉදිකර තිබීම, ඡන්ත පථය (Arcade Line) ආවරණය කර වර්ග මීටර් 40.61 ක අනවසර ඉදිකිරිමක් සිදුකර තිබීම, වාහන ගාල් කිරිම සඳහා ඉදිකර ඇති කොටස ගබඩාවක් ලෙස භාවිතා කිරිම සහ හිස් අවකාශය ආවරණය වන පරිදි මහල් 5 කින් යුත් වර්ග මීටර් 533.46 ක අනවසර ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණි. | පිළිතුරු ලබාදී නැත. | අනවසර ඉදිකිරිම් ඉවත් කිරිම සඳහා නිත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීම |

| | | | |
|---|---|---|---|
| (ඇ) | නිවාස සංකීර්ණවලින් කුලී අයවීම ඉතාම අවම අගයක් ගෙන තිබූ අතර 2020 දෙසැම්බර් 31 දිනට හිඟයෙන් අයවීම සියයට 7 ක් වැනි ඉතා අඩු මට්ටමක පැවතුනි. හිඟ නිවාස කුලිය අඛන්ඩව ඉහළ යාමක් නිරීක්ෂණය වූ අතර 2018 දෙසැම්බර් 31 දිනට පැවති රු.10,544,133 ක් වූ හිඟ නිවාස කුලිය 2020 දෙසැම්බර් 31 දින වන විට රු.18,081,706 ක් දක්වා වර්ධනය වී තිබුණි. | කඩිනමින් හිඟ මුදල් අයකර ගැනීමට බලාපොරොත්තු වේ. | කඩිනමින් හිඟ නිවාස කුලී අයකර ගැනීමට ක්‍රියා කිරීම. |

**3.3** මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සී.ඩබ්ලිව්.ඩබ්ලිව්.කන්නන්ගර මාවත, කොළඹ 07 පිහිටි අංක. 15, 17, 19, 25, 29 සහ 35 දරන ඉඩම් කට්ටි ඒකාබද්ධ කිරිමට අදාලව 2016 සැප්තැම්බර් 5 දින නීති අංශයේ වාර්තාව ප්‍රකාරව ඒකාබද්ධ කළ යුතු ඉඩම් කොටස්වල ඇතුලත පිවිසුම් මාර්ගවල අයිතිය තහවුරු කර නොමැති බැවින් එම කොටස් ඒකාබද්ධ කළ නොහැකි බව දන්වා තිබුණි. නමුත් නාගරික කොමසාරිස් විසින් ඉඩම් කට්ටි හා ඇතුලත පිවිසුම් මාර්ග ඒකාබද්ධ කිරිම අනුමත කර තිබූ අතර 2016 සැප්තැම්බර් 07 දින අධ්‍යක්ෂක (නගර සැලසුම්) විසින් නාගරික කොමසාරිස්ගේ සටහනට අනුව ඉඩම් ඒකාබද්ධ කිරිමට අදාල අංක 016016 දරන 2016 ජනවාරි 08 දිනැති පිඹුරුපත අංක ME/PBW/SD/06/2016 යටතේ 2016 සැප්තැම්බර් 22 දින අනුමත කර නිකුත් කර තිබුණි. | පිළිගනිමි. | නීත්‍යානුකූල නොවන ඉඩම් කට්ටි ඒකාබද්ධ කිරීම සම්බන්ධයෙන් නැවත පරික්ෂා කර එම වැරදි නිවැරදි කිරීමට සහ ඊට වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව කටයුතු කිරීම. |
| (ආ) | නො/9/1 බැල්කොබේ පෙදෙස, කොළඹ 8 ඉඩම ඒකාබද්ධ කිරිම සම්බන්ධයෙන් 2018 අප්‍රේල් 20 දිනැති නීති අංශයේ වාර්තාව මඟින් ඇතුළත මාර්ගවල අයිතිය තහවුරු කර නොමැති බැවින් ඉඩම ඒකාබද්ධ කළ නොහැකි බව දන්වා තිබු නමුත් නාගරික කොමසාරිස් විසින් අංක 10492 දරන 2012 දෙසැම්බර් 17 දිනැති කැබලි ඒකාබද්ධ කිරිමේ පිඹුරුපත 2018 සැප්තැම්බර් 15 දින අනුමත කර තිබුණි. | පිළිතුරු පසුව ඉදිරිපත් කරමි. | නීත්‍යානුකූල නොවන ඉඩම් කට්ටි ඒකාබද්ධ කිරීම සම්බන්ධයෙන් නැවත පරික්ෂා කර එම වැරදි නිවැරදි කිරීමට සහ ඊට වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව කටයුතු කිරීම. |
| (ඇ) | අංක 91 මිලාගිරිය ඇවනිවු, කොළඹ 05, ඉඩම සඳහා වු සැලසුම පරිදි යාන්ත්‍රික රථ වාහන නැවැත්වීමේ පද්ධතියක් ස්ථාපිත කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොමැති නිසා 2019 පෙබරවාරි 21 දිනැති අනුකූලතා සහතිකය සඳහා ඉල්ලුම් පත්‍රය සැලසුම් කමිටුව විසින් අනුමත කර නොතිබු නමුත් නාගරික කොමසාරිස් විසින් 2019 අප්‍රේල් 04 දින අනුකූලතා සහතිකය නිකුත් කර තිබුණි. | පිළිතුරු පසුව ඉදිරිපත් කරමි. | නිකුත් කර ඇති අනුකූලතා සහතිකයේ නිවැරදිතාවය සම්බන්ධයෙන් නැවත පරික්ෂා කර වැරදි නිවැරදි කිරීම සහ එම වැරදි සිදුකල නිලධාරීන්ට එරෙහිව කටයුතු කිරීම. |

## 3.4 ව්‍යාපෘති, කර්තව්‍යන් හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016 වර්ෂයේදි ආරම්භ කරන ලද කොන්ත්‍රාත් වටිනාකම රු.147,182,795 ක් වූ ව්‍යාපෘති 3 ක් අවසන් කළ යුතු කාල සීමාව සහ දින දීර්ඝ කරන ලද කාල සීමාවද ඉක්මවා 2021 මාර්තු 01 දින වන විටත් වැඩ අවසන්ව නොපැවතුණි. මෙම ව්‍යාපෘති 3 සඳහා 2020 දෙසැම්බර් 31 දිනට දරා ඇති වියදම රු.67,863,340 ක් විය. | පිළිතුරු ඉදිරිපත් කර නැත. | කඩිනමින් ව්‍යාපෘති අවසන් කිරීමට කටයුතු කිරිම. |

## 3.5 කොන්ත්‍රාත් පරිපාලනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කැම්බල් උද්‍යානයේ මධ්‍යම නඩත්තු ඒකකය සඳහා ඩිපෝ ගොඩනැගිල්ල ඉදිකිරිම සඳහා රු.37,305,576 ක වටිනාකමට කොන්ත්‍රාත්කරුවකු තෝරාගෙන තිබුණි. 2019 පෙබරවාරි වැඩ අවසන් කළ යුතුව තිබු අතර 2021 පෙබරවාරි වන විටත් වැඩ අවසන් කර නොතිබුණි. කොන්ත්‍රාත්කරුගෙන් අය කර ගත යුතු ප්‍රමාද ගාස්තුව රු.2,275,640 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගෙන නොතිබුණි. අත්තිකාරම් රු.6,670,832 ක් ගෙවා තිබු අතර එයින් රු.1,870,665 ක් පමණක් අයකර ගෙන තිබුණි. | ඉදිරියේදී ප්‍රමාද ගාස්තු සහ අත්තිකාරම් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. | ප්‍රමාද ගාස්තු හා අත්තිකාරම් මුදල් කඩිනමින් අයකර ගැනීම. |
| (ආ) | කොළඹ මහජන පුස්තකාලයේ ප්‍රධාන ගොඩනැගිල්ල හා ආපනශාලාව නවීකරණය සඳහා රු.75,762,695 ක අවම මිල ඉදිරිපත් කර තිබු කොන්ත්‍රාත්කරුට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට 2018 දෙසැම්බර් මස තාක්ෂණික කමිටුව නිර්දේශ කර තිබුණි. අධ්‍යක්ෂක (ව්‍යාපෘති) විසින් නිර්දේශිත කොන්ත්‍රාත්කරු පිළිබඳ වැරදි වාර්තාවක් 2019 මාර්තු 11 මුදල් ස්ථාවර කමිටුවට ඉදිරිපත් කිරීම නිසා 2019 මාර්තු 28 දින පැවති මහා සභාව විසින් කොන්ත්‍රාත්කරුට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර නොතිබුණි. 2020 සැප්තැම්බර් 29 දින මහා සභාව විසින් මෙම කොන්ත්‍රාත්තුව නැවතත් පෙර කොන්ත්‍රාත්කරු වෙත රු.82,053,741 ක වටිනාකමට පිරිනමා තිබුණි. මේ අනුව නිළධාරින්ගේ නොසැලකිලිමත්භාවය හේතුවෙන් සභාවට රු.6,291,046 ක මුලා අලාභයක් සිදු වී තිබුණි. | පිළිතුරු ලබාදී නැත. | අලාභය වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනිමට ක්‍රියා කිරීම. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2021 මාර්තු 23 දින එනම් දින 23 ක ප්‍රමාදයකින් පසු විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි. | රට තුළ පැවති වාතාවරණය නිසා නියමිත දිනට ඉදිරිපත් කළ නොහැකි වූ බව කාරුණිකව දැනුම් දෙමි. | නියමිත කාල සීමාවන් තුළ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම. |

### 4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබූ නමුත් එය 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාරව පිළියෙල කර නොතිබුණි. එනම් සමාලෝචිත වර්ෂයට අදාළ වාර්ෂික අයවැය පදනම් කරගත් ප්‍රමුඛතා අනුව සකස් කළ ක්‍රියාකාරකම් සැලසුම, ක්‍රියාත්මක කාල රාමුව, එම ක්‍රියාකාරකම්වලින් අපේක්ෂිත නිමවුම්/ ප්‍රතිඵල සඳහන් කර නොතිබුණි. එක් එක් ආදායම්, වියදම් ශීර්ෂ යටතේ ආදායම් එකතු කිරීම හා වියදම් පිළිබඳ සැලැස්මක් හා ඒවායේ කාර්යසාධන දර්ශක හඳුනාගෙන නොතිබුණි. කාර්යසාධනයේ ප්‍රතිඵල මත මූල්‍ය ප්‍රකාශන සමඟ කාර්යසාධන වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවත් එයද ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කර ඇත. | විධිමත් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කිරීම. |

### 4.3 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන විමසුම් 23 ක් නිකුත් කර තිබුණු නමුත් 2021 පෙබරවාරි 28 දින වන විට විගණන විමසුම් 4 ක නිර්දේශ පමණක් ක්‍රියාත්මක කර තිබුණි. | අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර ඇත. | අභ්‍යන්තර විගණනයේ අරමුණු ඉටු වන ආකාරයට කටයුතු කළ යුතුය. |

**4.4 නොවිසඳී ඇති විගණන ඡේද**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 1. | 2003 සිට 2016 වර්ෂය දක්වා හඳුනාගෙන තිබූ රු.214,628,001 ක හිඟ වරිපනම් ගෙවීමට තිබූ දේපළ 193 ක් එම දේපළවල හිමිකරුවන් පිළිබඳව හා අවසන් වරට හිමිකම් කියනු ලබන ඔප්පු හා පිඹුරු සොයා ගැනීමට නොහැකි වීම මත 2020 දෙසැම්බර් 31 දින වන විටත් මහා නගර සභා ආඥා පනතේ 259 වගන්තිය ප්‍රකාරව විකුණුම් සහතික ලිවීමට කටයුතු කර නොතිබුණි. | වෙන්දේසි කළද මේ දක්වා ඔප්පුවක් මඟින් සභාවට පවරාගෙන නොමැති දේපළවල හිඟ මුදල් ගෙවීම සඳහා දේපළ හිමිකරුවන් ඉල්ලීම් ඉදිරිපත් කරන බැවින් නාගරික කොමසාරිස්ගේ අනුමැතිය මත මෙම දේපළවලින් හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කර ඇත. | කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතුය |
| 2. | අංක 45, මාකස් ප්‍රනාන්දු මාවතේ පිහිටි ටෙනිස් ක්‍රීඩා පිටියේ බදු ගිවිසුම 1983 සැප්තැම්බර් 30 දින අවසන්වී තිබූ අතර එතැන් සිට 1985 මැයි 31 දින දක්වා මාස 20 ක කාලයක් සඳහා ගණනය කරන ලද ආර්ථික කුලියක් අය කළ යුතු වුවත් 1958 ගිවිසුම්ගත මාසික බදු කුලිය වූ රු.100 පදනම් කරගෙන බදුකුලී අයකර තිබුණි. එසේම ටෙනිස් ක්‍රීඩාපිටිය බදුගත් ක්‍රීඩා සංගමය විසින් 1958 වර්ෂයේ සිට ක්‍රීඩාපිටියට යාබද නගර සභාව සතු පර්චස් 55 ක බිම් කොටසක් නීත්‍යානුකූල නොවන අයුරින් පරිහරණය කරමින් පැවති අතර මේ සම්බන්ධයෙන් 2020 දෙසැම්බර් 31 දින වන විටත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ඉදිරි වසර 30 ක කාල පරිච්ඡේදය සඳහා බද්දට ලබා දිමට කෙටුම්පත් යෝජනාවක් මහා සභාව වෙත ඉදිරිපත් කර ඇත. ඒ අනුව විධිමත් ගිවිසුමකට එළඹ සියළු හිඟ මුදල් අයකර ගැනීමට පියවර ගනු ලැබේ | ගිවිසුම්වලට එළඹීම හා හිඟ මුදල් අයකර ගැනීමට ක්‍රියා කිරීම |
| 3. | ක්ලිෆ්ටන් බාලිකා මහා විද්‍යාලය පිටුපස පිහිටි තාප්පය මත සහ ඊට ආසන්නයේ ඉදි කිරීම ආරම්භ කර තිබූ ගොඩනැගිල්ලේ බිම් මහලේ සිට පළමු මහල දක්වා ඉදිකිරීම් කටයුතු නිම කර තිබුණි. තවද විදුහලේ මායිම් තාප්පය සම්බන්ධ කර 10" X 15" ප්‍රමාණයේ තනිමහල් ඉදි කිරීමක් සිදුකර තිබුණි. මෙම අනවසර ඉදිකිරීම් ඉවත් කර දෙන ලෙස අවස්ථා ගණනාවකදී පාසල් බලධාරීන් විසින් කොළඹ මහා නගර සභාවට දැනුම් දී තිබුණි. බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ ප්‍රධාන නීති නිලධාරීගේ 2019 අගෝස්තු 21 දිනැති ලිපිය මගින් මෙම අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට පියවර ගන්නා ලෙස නාගරික කොමසාරිස් වෙත දන්වා ඇතත් 2020 දෙසැම්බර් 31 දින වන විටත් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | අනවසර ඉදිකිරිම සඳහා නීතිමය ක්‍රියා මාර්ග ආරම්භ කර ඇත. | අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට කටයුතු කිරීම. |

| | | | |
|---|---|---|---|
| 4. | නගරයේ ඇති අවුරුදු 100 කට වඩා පැරණි ගස්වල කඳ හා මුල්වල තත්ත්වය මැනීමට හා පරීක්ෂා කිරීමට 2015 වර්ෂයේදී රු.මිලියන 7.4 ක් වැය කර ඉඩම් හා පරිසර සංවර්ධන අංශය විසින් මිලදී ගෙන තිබූ ගසේ ව්‍යුහය පරීක්ෂා කිරීමේ යන්ත්‍රය 2020 දෙසැම්බර් 31 දින වන විට අවුරුදු 06 ක් ගත වී ඇතත් භාවිතයෙන් තොරව විහාරමහාදේවී උද්‍යාන කාර්යාලයෙහි තබා තිබුණි. | යන්ත්‍රය මඟින් ලබාදෙන දත්ත විශ්ලේෂණය කළ හැකි නිළධාරියෙකු බඳවා ගැනීමට කටයුතු කිරීම සහ දත්ත විශ්ලේෂණය සඳහා යන්ත්‍රය මිලදී ගත් ආයතනය හා සාකච්ඡා පැවැත්වීම. | කඩිනමින් භාවිතයට ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම. |
| 5 | මල්වත්ත පාර පදික වෙළඳ සංකීර්ණය සඳහා එකක් රු.29,325 ක් බැගින් බක්කි 200 ක් රු.5,865,000 කට 2016 සැප්තැම්බර් මස මිලදීගෙන තිබූ අතර 2020 දෙසැම්බර් 31 දින වන විටත් මෙම බක්කි කඩ ඵලදායි කාර්යයකට යොදවා නොමැතිව ස්වාභාවික ආපදාවන්ට ගොදුරු වෙමින් අනාරක්ෂිතව නිශ්ප්‍රයෝජන තත්ත්වයට පත්වෙමින් පැවතුණි. | බක්කි ලබා ගැනීම වෙළඳුන් විසින් ප්‍රතික්ෂේප කළ බැවින් ඵලදායි කාර්යයට යොදා ගත නොහැකි වුවත් එම බක්කි කඩ වෙනත් පොදු වෙළඳපොළ අවශ්‍යතා මත යොදා ගැනීම සඳහා යෝජනා කර ඇත. | කඩිනමින් ඵලදායි කාර්යයන් සඳහා යොදා ගැනීම. |
| 6 | 2018 මාර්තු 16 දින රු.4,242,000 ක් වටිනාකමට මිලදීගෙන තිබූ කැන්ගරු රයිඩර් යන්ත්‍රය මිලදීගෙන මාස 02 ක් පමණ ඇතුළත කැඩියාම නිසා එය 2018 වර්ෂයේ සිට භාවිතයෙන් ඉවත්කර ඇත. මෙහි වගකීමේ කාල සීමාවද 2020 මාර්තු මස අවසන් වී ඇති අතර නාගරික කොමසාරිස්ගේ අංක MT/ADM/AQ/2021/02 දරන 2021 මැයි 08 දිනැති ලිපිය මඟින් සැපයුම්කාර ආයතනයට ගෙවූ මුදල් ආපසු ලබා ගැනීමට කටයුතු කරන බවත් එසේ නොමැතිනම් නිත්‍යානුකූලව කටයුතු කරන බවත් දන්වා තිබුණි. | 2021.04.07 දිනැති මහ සභා තීරණය පරිදි සැපයුම්කරුට විරුද්ධව නඩු පැවරීමට අවශ්‍ය කටයුතු ඉටු කිරීම සඳහා නීති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. | නීතිමය ක්‍රියාමාර්ග ගැනීම |
| 7 | සභාවට අයත් මෝදර Elie House ඉඩමෙන් පර්චස් 50 ක් 1992 ජූලි මස ආයතනයකට බදු දී තිබූ අතර එම ඉඩමෙහි ඉතිරි පර්චස් 60 ක ප්‍රමාණයද අනවසරයෙන් එම ආයතනය විසින් තම කටයුතු සඳහා භාවිතා කරන බව නිරීක්ෂණය විය. එහි අනවසර ඉදිකිරීම් කර ඇති බව අනාවරණය වී ඇතත් ඒ සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් සභාව විසින් ගෙන නොතිබුණි. | පර්චස් 20 ක භූමි ප්‍රමාණයක් ලබාදීමට සභා අනුමැතිය හිමි වී ඇත. | අනවසර අත්පත් කර ගැනීම් සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීම. |
| 8 | වරිපනම් අංක 43, බාන්ස් පෙදෙස, කුරුඳුවත්ත පිහිටි පර්චස් 154.43 විශාලත්වයක් ඇති දේපල හිමිකරු විසින් වර්ෂයක් ඇතුළත වරිපනම් නොගෙවීම නිසා මහා නගර සභා ආඥා පනතේ අංක 263 වගන්තිය ප්‍රකාරව 1974 ඔක්තෝබර් 07 දින කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේදී මිලදී ගැනීමේ සහතිකය ලියාපදිංචි කර දේපලේ නීත්‍යානුකූල අයිතිය සභාවට පවරාගෙන ඇතත් 2020 දෙසැම්බර් 31 දින වන විටත් ඉඩමේ භුක්තිය නගර සභාවට පවරා ගැනීමට ක්‍රියාකර නොතිබුණි. | භුක්තිය ලබා ගැනීම සඳහා කොළඹ මහ නගර සභාවේ නීති දෙපාර්තමේන්තුව විසින් කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ 63194/5/16 දරන අංකය යටතේ පවරා ඇති නඩුව 2021 සැප්තැම්බර් 06 වන දින කැඳවීමට නියමිතව ඇත. | ඉඩමේ භුක්තිය ලබා ගැනීමට කටයුතු කිරීම |

| | | | |
|---|---|---|---|
| 9 | ස්ථාන මාරුවීම් ලැබූ හා විශ්‍රාම ගිය නිලධාරීන් හා සේවකයන් 23 දෙනෙකු 2020 දෙසැම්බර් 31 දින වන විටත් නිල නිවාස භුක්ති විඳින බැවින් ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 7.2 වගන්තිය ප්‍රකාරව දණ්ඩන කුලිය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. 2020 ජුනි වන විට ස්ථාන මාරු ලැබූ නාගරික කොමසාරිස්වරුන් දෙදෙනෙකුගෙන් අයකරගත යුතු දණ්ඩන කුලිය රු.27,100,751 ක් ලෙස ගණනය කර ඇතත් 2020 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | ජේ.එම්.බී. ජයවර්ධන මිය හා වී.කේ.ඒ.අනුර මයා හට අදාළ දණ්ඩන කුලිය ගණනය කර ඔවුන්ගේ සේවා ස්ථාන වෙත අය කර ගැනීම සඳහා යොමු කර ඇත | කඩිනමින් අයකර ගැනීමට කටයුතු කිරීම |
| 10 | මහජන ආධාර දෙපාර්තමේන්තුව සතු නිළ නිවසක වාසය කළ හිටපු පුනාා කොමසාරිස්වරයකු අධිකරණ නියෝගයක් මගින් 2016 ජනවාරි 27 දින නිවසින් ඉවත් කර ඇතත් තවදුරටත් ඔහුගෙන් අයවිය යුතු නිවාස කුලිය රු.292,790 ක් අයකර ගෙන නොතිබුණි. | අය විය යුතු දණ්ඩන කුලිය සමඟ මුළු කුලී මුදල වන රු. 386,185 ක් අය කර ගැනීම සඳහා නීති අංශයට යොමු කර ඇත. | කඩිනමින් අයකර ගැනීමට කටයුතු කිරීම |
| 11 | හිටපු ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විශ්‍රාම ගත් පසුව ද නිල නිවස ආපසු සභාවට භාර නොදීම නිසා ආයතන සංග්‍රහයේ XIX වන පරිච්ඡේදයේ 7.2 වගන්තිය ප්‍රකාරව සභාවට අයවිය යුතු දණ්ඩන නිවාස කුලිය වූ රු.8,019,751 ක් අදාළ නිලධාරියාගෙන් අය කර ගත යුතු බව 2019 නොවැම්බර් 31 දින පැවති මහා සභාව මගින් සම්මත කර තිබුණද 2020 දෙසැම්බර් 31 දින තෙක් අයකර ගෙන නොතිබුණි. | හිටපු ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිගෙන් අය විය යුතු රු.8,019,751 ක දණ්ඩන කුලිය අය කිරීම සඳහා නීති අංශය වෙත උපදෙස් දී ඇත. | කඩිනමින් අයකර ගැනීමට කටයුතු කිරීම |
| 12 | නාගරික ලේකම් දෙපාර්තමේන්තුවට අයත් අංක WP – KA9959 දරන වාහනය 2017 සැප්තැම්බර් 04 දින අනතුරකට ලක් වී තිබූ අතර ඒ සම්බන්ධයෙන් පත් කරන ලද කමිටුව විසින් 2018 සැප්තැම්බර් 27 දින ඉදිරිපත් කරන ලද වාර්තාව අනුව වාහන අනතුර නිසා සභාවට සිදු වූ රු.262,924 ක අලාභය වාහනය අනුයුක්ත කර තිබූ නිළධාරීයාගෙන් සහ වාහනය භාර රියදුරුගෙන් සම සමව අයකර ගත යුතු බව නිර්දේශ කර තිබූ නමුත් 2020 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි | රියදුරු ආර්.පී.ගුණසේන මයා සියලු චෝදනාවලට නිවැරදිකරු බව තීරණය කර නිදොස් කොට නිදහස් කර ඇති බව නාගරික කොමසාරිස්ගේ අංක නාලේ/ආර්ඩී6/විමර්ශන/2018(1)130 හා 2021.02.08 දිනැති ලිපිය මගින් දන්වා ඇත. රු.131,462 ක අලාභය, හිටපු නාගරික ලේකම් එච්.ඩී.සී.ජානකි මියගෙන් අයකර ගැනීම සඳහා වැඩපිළිවෙලක් සකස්කර දෙන ලෙස ඉල්ලා රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම් වෙත 2018.12.10 දිනැති ලිපිය මගින් දන්වා ඇත. | කඩිනමින් අලාභය අයකර ගැනීමට කටයුතු කිරීම |